www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# Royal College - Colombo 07
# රාජකීය විද්‍යාලය- කොළඹ 07

## Grade 9 – First Term Test - 2019
## පළමු වාර පරීක්ෂණය – 2019 - 9 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

## Roman Catholic
## කතෝලික ධර්මය - I

Name :- .................................................... Class : -............... Index no:- ..............................

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලියන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පුරාණ ගිවිසුමේ පොත් වර්ගීකරණයේ හතරවන කාණ්ඩය වන්නේ,

(1) ඉතිහාස පොත්ය (2) ප්‍රේම ගීය (3) ලෙවී ග්‍රන්ථය (4) දිවැසිවර ග්‍රන්ථය

02. "ඔබේ වචන මගේ දෙපයට පහනක්ය. මාගේ මාවතට එළියක්ය." මෙම පාඨය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

(1) උත්පත්ති ග්‍රන්ථය (2) ගණන් කතාව (3) ගීතාවලිය (4) එළිදරව් සාහිත්‍යය

03. දිවැසිවර ග්‍රන්ථ අතර හයවන තැනට යෙදෙන්නේ

(1) හොසියා (2) එස්රා (3) ජොබ් (4) සිරාක්

04. නව ගිවිසුමේ සංදේශ ................ ක් ඇත.

හිස්තැනට සුදුසු සංඛ්‍යාව වන්නේ

(1) 18 කි (2) 21 කි (3) 16 කි (4) 7 කි

05. මුල් කිතුනු සභාව ආරම්භ වී වර්ධනය වූ ආකාරය දැක්වෙන්නේ

(1) එළිදරව් සාහිත්‍යයේය (2) සංදේශ වලය
(3) අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත්ය (4) උත්පත්ති පොතේය

06. කිතුනුවන්ට විරුද්ධ ව පැමිණි පීඩන වලට මුහුණදුන් විශ්වාසිකයන් දිරිගැන්වීම සඳහා ලියන ලද කෘතියකි

(1) අපොස්තුලුවරුන්ගේ ක්‍රියා පොත (2) එළිදරව් සාහිත්‍යය
(3) ජෝහාන් ශුභාරංචිය (4) ගණන් කතාව

07. සාම්ප්‍රදායිකව ගීතාවලියෙහි කර්තෘ ලෙස පිළිගනු ලබන්නේ

(1) දාවිත් රජතුමාය (2) සැවුල් රජතුමාය
(3) සලමොන් රජතුමා (4) හෙරෝද් රජතුමා

08. බැටලු එඬේරෙක් වූයේ කවුරුන්ද ?

(1) කායින්ය (2) පේදුරු තුමාය (3) ආබෙල්ය (4) නතානියෙල්ය

09. චතාරික සමයේ ජන වන්දනාවට භාවිතා කරන වර්ණය වන්නේ

(1) නිල් වර්ණය (2) කොළ වර්ණය
(3) සුදු වර්ණය (4) දම් වර්ණය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම ඇවිරිණි / All Rights Reserved

10. ගීතාවලියේ පොත් කාණ්ඩ සමාන වනුයේ

(1) නව ගිවිසුමටය (2) පංච පුස්තකය (3) පුරාණ ගිවිසුමටය (4) දස පනතය

11. මෙම හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.

සියොන් යනුවෙන් හඳුන්වන්නේ .........................

(1) බෙත්ලෙහෙමය (2) ජෙරුසලමය (3) රෝමය ය (4) පලස්තීනය

12. ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීම සඳහා ජනතාවට යහ මග පෙන්වන ඉගැන්වීම් අන්තර ගත ගීතිකා මේ නමින් හැඳින්වේ.

(1) රාජකීය ගීතිකා (2) විශ්වාසයේ ගීතිකා

(3) සියොන් ගීතිකා (4) ප්‍රඥා ගීතිකා

13. " දිවි ඇතිතාක් නුඹ වෙහෙස මහන්සි වී පොළොවෙන් ආහාර ලබා ගන්නීය " යනුවෙන් දේව දඬුවමට පාත්‍ර වනුයේ,

(1) කායින් ය (2) ආදම් ය (3) නෝවාය (4) ආබෙල් ය

14. නව මැවිල්ලේ ආරම්භකයා ලෙස දෙවියන් වහන්සේ තෝරා ගත්තේ

(1) ක්‍රිස්තුස් වහන්සේය (2) ආදම්ය (3) නෝවා ය (4) ආබෙල්ය

15. දිව්‍ය සංරක්ෂණය සංකේතාත්මකව ඉදිරිපත් කරනුයේ

(1) ජල ගැල්ම මගිනි (2) දේදුන්න මගිනි

(3) නෝවා සෑදූ නැව මගිනි (4) බැටලුවා මගිනි

16. තමන් කළ වරදට කායින්ට ලැබුණ දඬුවම වූයේ

(1) නැවක දූවිලි බවට පත්වීමය (2) වගා කිරීමෙන් ආහාර සපයා ගැනීමය

(3) බිමට ජලය නොලැබීමය (4) පොළොවෙන් නෙරපා දැමීම ය

17. දෙවියන් වහන්සේ ආදි මව්පියන්ට ගැලවුම්කරුවෙකු එවීමට පොරොන්දු වූයේ

(1) අහිමිවූ දේව සබඳතා යළි ඇති කිරීමටය (2) දෙවියන් වහන්සේගේ බලය පෙන්වීමටය

(3) යක්ෂයාගේ ක්‍රියාකාරකම් අවසන් කිරීමටය 64) කළ වරදට ආදි මව්පියන්ට දඬුවම් දීමටය

18. නෝවාගේ පුත්‍රයෙක් නොවන්නේ,

(1) ෂෙම් ය (2) හොම් ය (3) හාම් ය (4) ජපෙත් ය

19. ආදම් සහ ඒව සිදුකළ පාපය වන්නේ

(1) ඇපල් ගසේ ගෙඩි කෑමය (2) දෙවියන් වහන්සේට අකීකරු වීමය

(3) ඒදන් උයනින් පළා යාමය (4) කොළ අතු වලින් ඇඳුම් ඇඳීමය

20. ජේසුස් වහන්සේ කොටළුවකු පිට නැගී ජයග්‍රාහී ලෙස ඇතුළු වූ නගරය වන්නේ

(1) සමාරියාවට ය (2) පාදුවාවට ය

(3) ජෙරුසලමට ය (4) දමස්කස් නගරයට ය

(ලකුණු 2x 20 = 40)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

## II – කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01. (1) සමදර්ශක ශුභාරංචි දෙකක් නම් කරන්න. (ලකුණු 02)
 (2) මාක් ශුභාරංචියේ අරමුණ ලියන්න. (ලකුණු 02)
 (3) මතෙව් ශුභාරංචිය සඳහා භාවිතා වන නම් දෙකක් ලියන්න. (ලකුණු 02)
 (4) ජේසුස් වහන්සේගේ බෞතීස්මය සමදර්ශක ශුභාරංචි කතුවරුන් දකින එක් ආකාරයක් ලියා දක්වන්න. (ල.3)
 (5) ජොහාන් ශුභාරංචියේ සඳහන් වන "මම වෙමි" ප්‍රකාශන තුනක් ලියන්න. (ලකුණු 03)
 (6) ඔබගේ ජීවිතය සාර්ථකව එල දැරීමට ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධ වන්නට කරන ක්‍රියාකාරකම් හතරක් ලියන්න. (ලකුණු 04)

02. (1) ගීතාවලිය ග්‍රන්ථය පිළිබඳ වාක්‍ය 3ක් ලියන්න. (ලකුණු 03)
 (2) ගීතාවලිය ග්‍රන්ථය නැතිවම බැරි අවස්ථාවන් තුන ලියන්න. (ලකුණු 03)
 (3) දෙවියන් වහන්සේ ඔබට ලබාදුන් දක්ෂතා වෙනුවෙන් ප්‍රශංසා කිරීමට සුදුසු යාච්ඤාවක් ලියන්න. (ලකුණු 05)

03. (1) දෙවියන් වහන්සේ ආදම් සහ ඒවට දුන් අවවාදය ලියන්න (ලකුණු 03)
 (2) ආදම් සහ ඒවා පාපයට වැටුණු ආකාරය ලියන්න. (ලකුණු 03)
 (3) ඔබ පාපයට නොවැටී ජේසුස් වහන්සේව අනුගමනය කරන ආකාරයන් 5ක් ලියන්න. (ලකුණු 05)

04. (1) දෙවියන් වහන්සේ දුන් විමුක්තියේ පොරොන්දුව කුමක්ද? එය දුන්නේ කාටදැයි ලියන්න (ලකුණු 03)
 (2) පහත සඳහන් වචන වලින් හැඳින්වෙන දෑ ලියන්න.
  (1) ස්ත්‍රියගේ වංශය -
  (2) සර්පයා -
  (3) " ඔහු " - (ලකුණු 03)
 (3) දෙවියන් වහන්සේගේ ආදරය හා කරුණාව අපට ලබාගැනීමට නම් අපද අන් අයට ආදරය හා කරුණාව දක්විය යුතුයි." ඒ සඳහා ඔබ කරණ දේවල් 5ක් ලියා දක්වන්න. (ලකුණු 05)

05. (1) ආදම් සහ ඒවාගේ පුතුන් දෙදෙනා නම් කර ඔවුන් පුජා කළ දෙවියන් වහන්සේට ප්‍රසන්න නොවූ පඩුර නම් කරන්න. (ලකුණු 03)
 (2) ඔවුන් විසින් සිදුකළ පාපය ලියන්න. (ලකුණු 03)
 (3) දේව දරුවන් ලෙස ඔබ අන් අයට නොකළ යුතු දේවල් 5ක් ලියන්න. (ලකු ණු 05)

06. (1) වර්තමාන සමාජයේ ඇති පාපී ක්‍රියා 3ක් ලියන්න. (ලකුණු 03)
 (2) දෙවියන් වහන්සේ පාපය ලෝකයෙන් නැති කිරීමට සිදුකල දෙය ලියන්න (ලකුණු 03)
 (3) ඔබ පාපයෙන් ඈත්වී ශුද්ධවන්ත ජීවිතයක් ගත කිරීමට කළයුතු දේවල් 5ක් ලියන්න. (ලකුණු 05)

07. (1) පාස්කු අභිරහස යනු කුමක්ද? (ලකුණු 03)
 (2) පාද නමස්කාරයේ ස්ථාන 3ක් නම් කරන්න. (ලකුණු 03)
 (3) චතාරික කාලය පිළිබඳ වාක්‍ය 5ක් ලියන්න. (ලකුණු 05)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
Agaram.LK - Keep your dreams alive!
agaram.lk